ස.සේ.කො.චක්‍රලේඛ අංක 02/2022

මගේ අංකය:ස.සේ.කො.1/චක්‍රලේඛ/iv/වෙළම,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2022.04.04.

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති / සාමාන්‍යාධිකාරී / කළමනාකරු

## සමුපකාර සේවකයින්ට මාසික දීමනාවක් ලබාදීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් සමුපකාර සමිති හා සමුපකාර සමිතිවල සේවකයින් විසින් මෙම කොමිෂන් සභාව වෙත කර ඇති ඉල්ලීම් සලකා බලා පහත විධිවිධානවලට යටත්ව දීමනා ගෙවීමට කටයුතු කළ හැකි බව 2022.03.30 දිනැති කොමිෂන් සභාව නියම කර ඇත.

02 වයඹ පළාතේ සමුපකාර සමිතියකට/සංගමයකට/මණ්ඩලයකට දීමනා ගෙවීමට මූල්‍ය හැකියාව ඇති බවට සමිතියේ/සංගමයේ/මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය/ කාරක සභාව විසින් තීරණය කරන්නේ නම් සමුපකාර සේවකයින් වෙනුවෙන් පහත සඳහන් සීමාවන්ට යටත්ව මාසික දීමනාවක් ගෙවිය හැකිය.

(අ) මූල්‍ය සේවා සමුපකාර සමිති (ස.ණ.ය සමිති හා ඒ හා සමාන තැන්පත් රැස් කිරීමේ හා ණයට ලබාදීමේ ව්‍යාපාරය ප්‍රධාන ව්‍යාපාර කටයුතු ලෙස සිදු කරන සමුපකාර සමිති) දීමනාව ගෙවනු ලබන මාසයට ආසන්න පෙර මස ශුද්ධ පොලී ආදායමින් දීමනාව ගෙවනු ලබන මාසයේ අදාල සියලු දීමනා සහිත මුළු වැටුප් ප්‍රතිශතය,

40% හෝ ඊට අඩු වන විට රු:5,000/ ක දීමනාවක් ගෙවීම
40% සිට 100% දක්වා රු:3,500/- ක දීමනාවක් ගෙවීම
100% වැඩි වන විට මෙම දීමනාව ගෙවීම නොකළ යුතුය.

වැටුප් වියදම් ප්‍රතිශතය = (සියලු දීමනා සහිත වැටුප / ශුද්ධ පොලී ආදායම) X 100

(ආ) විවිධ සේවා සමුපකාර සමිති, නිෂ්පාදන සමුපකාර සමිති හා සේවා සමුපකාර සමිති ඇතුළු අනෙකුත් සමුපකාර සමිති දීමනාව ගෙවනු ලබන මාසයට ආසන්නව පෙර සමස්ථ දළ ලාභයෙන්, දීමනාව ගෙවනු ලබන මාසයේ වැටුපට අදාල සියලු දීමනා සහිත මුළු වැටුප් වියදම් ප්‍රතිශතය,

65% හෝ ඊට අඩු වන්නේ නම් රු:5,000/- ක දීමනාවක් ගෙවීම
65% සිට 100% දක්වා රු:3500/- ක දීමනාවක් ගෙවීම
100% වැඩි වන විට මෙම දීමනාව ගෙවීම නොකළ යුතුය.

වැටුප් වියදම් ප්‍රතිශතය = (සියලු දීමනා සහිත වැටුප / සමස්ථ දළ ලාභය) X 100

03. සියලු දීමනා සහිත වැටුප ලෙස සැලකිය යුත්තේ ඒකාබද්ධ වැටුප, අනුමත දීමනා, සේවක අර්ථ සාධක, සේවක භාරකාර විශ්‍රාම වැටුප් දායකය සහ රු:5,000/- හෝ 3,500/- මුළු වටිනාකම සහිත මාසික වැටුප් වියදම වේ.

04. මෙම දීමනාව 2022 මාර්තු මස සිට ගෙවිය යුතුය.

05. මෙම දීමනාව සමුපකාර සේවක විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල ගෙවීමේ දී හෝ විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී අදාල නොවේ.

06. මෙම චක්‍රලේඛය වයඹ පළාත් සමුපකාර කොමසාරිස්/රෙජිස්ට්‍රාර් ගේ එකඟතාවය ඇතිව නිකුත් කරන ලදී.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

<u>පිටපත්</u>

01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත - කා.දැ.පි.

02. ලේකම්,සමුපකාර සංවර්ධන,වෙළඳ,ඉඩම්,විදුලිබල හා බලශක්ති,ක්‍රීඩා හා යෞවන කටයුතු - කා.දැ.පි.
සංස්කෘතික,කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

03. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.ගැ.පි. හා අ.ක.ස.

04. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි. හා අ.ක.ස.

05. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව - දැ.ගැ.පි. හා අ.ක.ස.